# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1866/41 - 2014 ජුනි මස 13 වැනි සිකුරාදා - 2014.06.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ජනාධිපති හා නාගරික සංවර්ධන විෂය භාර අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම් කොටස් තලවතුගොඩ නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වහා අවශ්‍යව ඇති බව මාගේ මතය වන හෙයින්. අදාළ ඉඩම් කොටස් එකී කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2014 මැයි මස 30 වැනි දින,
කොළඹ ජනාධිපති කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තලවතුගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ තලවතුගොඩ ගමේ පිහිටි බලයලත් ලියාපදිංචි මිනින්දෝරු එච්. නිලුපුල් ආර්. කරුණාතිලක මහතා විසින් මැන පිළියෙල කරන ලද අංක 2690 හා 2014.04.27 දින දරන සැලැස්මේ කැබලි අංක 1 හා 2 වශයෙන් පෙන්නුම් කෙරෙන ප්‍රමාණයෙන් හෙක්. 0.4838 (අක්. 01, රූඩ් 00, පර්. 31.30) පමණ වන ඉඩම් කොටස් වලට මායිම් :

**කැබලි අංක 1 - ප්‍රමාණය හෙක්ටයාර් 0.0490**

| | | |
|---|---|---|
| උතුරට | : | මු. පි. කො. 5516හි කැබලි අංක 14 සහ බත්තරමුල්ල - පන්නිපිටිය පාර ; |
| නැගෙනහිරට | : | බත්තරමුල්ල පන්නිපිටිය පාර ; |
| දකුණට | : | වරිපනම් අංක 708 දරන දේපළ ; |
| බටහිරට | : | මු. පි. කො. 5516හි කැබලි අංක 14. |

**කැබලි අංක 2 - ප්‍රමාණය හෙක්ටයාර් 0.4348**

| | | |
|---|---|---|
| උතුරට | : | වරිපනම් අංක 708 දරන දේපළ වෙන් කරන කාණුව ; |
| නැගෙනහිරට | : | බත්තරමුල්ල - පන්නිපිටිය පාර ; |
| දකුණට | : | මාදිවෙල පාර සහ වරිපනම් අංක 755, 755/1/1 සහ 755/2/1 ; |
| බටහිරට | : | මු. පි. කො. 5516හි කැබලි අංක 14. |

06 - 831

1A - G 19725 — 65 (2014/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*